# මේ එහෙමයි - එහෙත් එහෙමද ?

## සිරිමා මුදත්නායක

ඉන්දිය සාගරේ මුතු ඇටයකි බබලන
ලස්සන රටකි ලොව මේ සිරිලක
කලට වැසි වසී නියගය මේ නොමැත
සැම සම්පත් ඉතිරිව පිරී ඇතේ මේ දනන්හට
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

ලස්සන කඳු වැටි මැදින් ගලයි ඇල දෙල
බලන බලන අත දිලෙයි නිල් තණ කොල
වැවෙයි හැම පැල බුදිනට මේ වැසියන් හට
නමුත් අගේ නැත - ආවඩයි පිටරටටම
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

රජවරු ඉදිකල ඉතිහාසය පෙර
නටබුන් පමනයි දැන් ඉතිරිව ඇත
ඒවා පිලිසර කරන්නේ නොමැතිව
නසයි කුරුටු ගී සිගිරියෙත් අද
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

සදයි නගරවල මංමාවත් නිරතුරු
ඉතිරි කරන්නට අපේ බාලපරම්පරාවම
මගී පාලම් තිබුනත් හැමතැන - පාර හරහා
පනිනවා මෙහි හනිකට
ලැබෙයි අහන්නට හැමද අනතුරු
නැතේ හැදෙන්නේ මේවා පාඩම්
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

එහෙත් නැහැ නොවැ මෙතරම් අවන්හල්
ඕනැ ඒහ පසුපස දනෝ දුවන්නෝ
කම්මැලි වෙලා උයාපිහා නොගෙන
මේවා කාලා හැදෙයි හැදෙයි ලෙඩ -
ඉස්පිරිතාලෙත් පෝලිම් පිරිලා
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

ඉස්සර තිබු අපේ පාසල් නිවාඩුව
සෙල්ලම් කරනයි අපේ පොඩි උන්හට
අහෝ ! අද ඇදගෙන යනවා ටියුෂන් පන්තියට
දෙමාපියෝ පොරකන්නේ දෙන්නයි අමතර පාඩම්
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

පැය විසි හතරෙම ඇහෙන්නේ බුදු බණ
අහනවා පමනයි නැත හැදෙන්නේ මේ අය
පොහොසත් අය කරනවා ඉස්තරමට පිංකම්
නැත දෙන්නේ දුප්පතුන්ට නම් දන්
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

කූට වෙලඳුන් අනේ හම්බුකරන හැම සතේ
පාලනයක් තියෙනවා බඩු මිලේ -
උන් බඩු විකුනතයි තමන්ට රිසි සේ
කල්ගිය බඩු විකුනන්න බලන්නේ -
අතර මැදියෝ ටේකේ කරවන්නේ
හරිහම්බ කල තඹ දොයිතුවට දීලා -
හිස් අතිනුයි දුගියා ගෙදරට එන්නේ
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

ලක්මවගෙන් අකුරු උගත්තෝ -
වැඩිපඩි සොයලා ගොහින් පිටරට
උගතුන් නැහැනොව දැක්මෙහි ඇත්තේ -
පාලුවෙලා රට බැලූ හැමපැත්තේ
ගිය අය හට නැත රට ගැන ගානක් -
උපන්බිම අමතක කරලයි ඉන්නේ
අඬයි ලක්මව මේ ගැන හිතලා -
අපේ උන්ට නැහැ කිසිම වගක්වත්
මේ එහෙමයි - එහෙත් එහෙමද ?

හනිකට රැකගමු ලක්මව පෙර මිත්තන්සේ
කීවට නැත දනන්හට අගයක් වැටහෙන්නේ
කෙරෙයි තව ඉදිරියට විනාසේ
එතකොට පෙරහැර ගොසින් තියෙන්නේ
මේ එහෙමයි - එහෙත් එහෙමද ?




# ගමේ සර්පයින් කොළඹට

## ලක්ෂාන් මධුරංග වික්‍රමරත්න



ගමේ පොළොං බිත්තර ඔක්කොම
වැලි යට පුපුරන්න ඉස්සර
කොළඹටම පැමිණ ඇත සුරැකිව
මනම්පිටියේ කහ ගැහුණු ලොරි මත

මව් නැතිව කිරි පිරුණු ළයැතිව
ඇවිද යති ට්‍රැෆික් ඇති කර උමතුව
පියවරුන් තලා පොඩි කළ හදැතිව
නුගේගොඩ බෝ සෙවණ යට බෝ වුණ

තරු වැටී සඳ බිඳුණු අහසින
කිරි පැණි පතා සිටිනා පිරිවර
නොදනිතිය අනවසර තුඹසින
පිටමං කරන දින දැනෙන ගොරතර

දළ බිඳී මගට වැටි දිනයක
ඔබ සොයනුයේ ලොරි පැමිණි පාරය
ඒ මගේ ගමේ යන දවසක
මග දෙපස කඩු පොලු දැරූ මිනිසුන

විස පිරුණු මධු බඳුන් අතැතිව
කොටුව ළග රවුම් ගසනා සවසක
බලනු මැන උරෙනුර ගැටෙන දෑසක
පියාපත් සිඳී ගිය සිහිනය

boondi.lk

# සුදු කාසි සොයාගිය හිමි සොයමි

## ලක්ෂ්මන් කොඩිතුවක්කු

කතරක් නොපෙනෙන
ක්ෂිතජය මැද්දෙන්
අඳුරු මංකඩ
රළක් මත්තෙන්

දරු පැටියනට හෙටක් සොයලා
දිවි තෙරම උකසකට තබලා
සුදු කාසියට පෙමින් බැඳිලා
ගියා මයෙ හිමි ඔරුවෙ නැගිලා

මුහුදු රැල්ල පිසගෙන එන සුළඟ මත
ඇඹුවෙමි රුවක් හිමි නුඹගේ සුවඳ වත
හිරු ගිනිගෙන දැවෙනා පෙම් දුකක හිත
ඔබ තුරුළට ගෙන වැලපෙයි කඳුළු නෙත

හැපි හැපි රලේ තෙරපෙන ඔරු කඳ අඳුරු
ඔබ රුව නිසල සැතපෙයි සිහිනෙක වියරු
සුදු පෙන රැලි අතුරයි පාවඩ මියුරු
මැවි මැවි පෙනෙයි මගෙ හිමි රුව මහ සයුරු

ජල කඳ මැදින් පීනා නැති බැරිකමට
බැඳිලා හිතක් සුදු කාසියෙ රන් බරට
ඉසුරු ලොවට පෙම් කල හිමි සකි සඳට
සාගර දියේ ඇයි විපතක් කළේ අපට

සාදා බෝට්ටුව කඩදහි කොළේ නවා
වැහි දිය මැද පද්දා ඔබ රුවක් මවා
කවදා හෝ ඔබ එන පෙරමග ලකුණු තබා
දරුවෝ බලයි පුන්සඳ හද පතුල දවා

අල්ලක් තරම් දිග මහ ඔරු කඳක නැගී
මල්ලක් පුරවගන්නයි ගියෙ හිමියො සකී
මළ පොත වයන දිය රළ හඬ සවන වැකී
පෙම් කළ ලමැද උණුවෙයි පෙම් සිසිල මැකී

සුළඟක් වෙලා පාවී ගොස් සයුර මැදින්
ගින්නක් වෙලා එන කුසගිනි පහුර මැදින්
හින්දා සයුර එන අපමණ සෝක මැදින්
හිමි ඔබ සොයමි ගලනා දුක් ගඟුල මැදින්

# රහසක් බියක් ප්‍රේමයක්

## මෙල්ස් මාකැස්චේ

රාත්‍රී යහනෙහි
නිරුවත්
ඔබ

මම
සවමි
කඩින් කඩ
නැගෙන එළිය
ඇතුළත අවුළුවයි

අඳුර මත
සැළෙන සෙවනැලි
බිය කරවයි

දෑස කිටිකර
පියා ගතිමි
එළියට
අඳුරට
කරබා ඉන්න ඉඩ දී

.boondi.lk

# Travels

## Asanki Ranaweera



We burry our bare feet as we saunter
along the tickling sandy coastline
The ocean hums a sweet melody
inviting lunar to shine
requesting solar to sink
Tiny edges of surfs
try to fill the space
between you and me
and gloomily leave our feet
back to normality
The ocean sweetly hums
inviting lunar to shine
requesting solar to sink




# විජය පුවත රාජාවලියෙන් ඉගෙන ගනිමු

(මෙය පොතේ ඇති සැටියටම ලියූවකි)

-සොළොස්මස්ථානයේ මොහොතක් මොහොතක් තක් සොළොස් තැනක වැඩ සිට ජේතවනාරාමයට වැඩි සේක-අද එතැන් සිට..........

,පිරිනිවන් පානා දින කුසිනාරා නුවරදී දස දහසක් සක්වළ දෙව් බඹුන්ට බණ වදාරා මාගේ ශාසනය පන් දහසක් අවුරුදු පවතිනා අනුසස් ඇත්තේය. ශ්‍රී ලංකාද්වීපයෙහි පෙර බුදු වූ කකුසඳ බුදුන්ගේ මහරි (මහා ශ්‍රී බෝධිය) බෝධිය පිහිටුවා ශාසනය ඇති කළේය. කාශ්‍යප බුදුන්ගේ නිග්‍රොධ බෝධිය පිහිටුවා ශාසනය ඇති කළේය. කෝණාගම බුදුන්ගේ උදුම්බරා බෝධිය පිහිටුවා ශාසනය ඇති කළේය. දැන් මාගේ ශ්‍රී මහා බෝධිය පිහිටුවා මිහිදු තෙර කෙනෙකුන් ශාසනය පන් දහසක් අවුරුදු පවතින්නේයයි දශදහසක් ශක්‍රයන් අතුරෙන් මේ මඟුල් සක්වල බලන ශක්‍රයන් ළඟට කැඳවා ශ්‍රී ලංකාව භාර කර දී පිරිනිවන් පෑ වදාළ සේක.

විජය රජ නුග සෙවණෝ උන් විට උපුල්වන් දෙවිඳු තපස් වෙස් ගෙන කසාවතින් ඇවිත් විජය කුමාරයා හට පිරිත් පැන් නූල් කරලා සත් සියයක් යොධයින්ඩ පිරිත් පැන් ඉස දෙව් ලොව ගියාහ. එදා යකුන් යග්ගිරි දිවයිනට ඇරියදා ඉතිරි වුණු යක්කු තම්මැන්නා වනය සැඟවී සිට ලග්ගල ලොග්ගල උන්නාහ. කුවේණියගේ ළැමද තන තුනින් මැද තනය මැකුණු විට හිමි කෙවකුන් ඇති බව ඉසිවරු කීවාට ළැමද තනය මැකුණෝය. හිමියකු ආ බව දැන නුග ගස මුලට පස් පාටකින් වර්ණ මවා ගෙන බැලි වෙසින් ඇවිත් නිරිඳුගේ පය ඉඹලා වෙණිය ගසා නොසිට ගියාය.,

මේ කියන විදිහට බුදු සසුන පවතින්නේ අව්රුදු පන්දහසකි . එනම් තව අව්රුදු 244 කි. කකුසඳ බුදුන් බුදු වී ඇත්තේ ශ්‍රී ලංකාද්වීපයේය. දස දහසක් ශක්‍රයන් අතරින් මේ මඟුල් සක්වළ රැකබලා ගෙන සිටියේ එක් ශක්‍රයෙකි. තවත් ශක්‍රයෝ 9999 දෙනෙක් වෙනත් සක්වලවල් රැකබලා ගෙන සිටිති. බුදුන් වහන්සේ (කලින් සකස් කර ගෙන තිබුණු) පිරිත් නූලුත් දුන්නේ ඒ ශක්‍රයාටය. එදා කට්ටි පැන තම්මැන්නා වනයේ සැඟවී සිටි යකුන් අතරින් එකක වූ කුවේණියට තන තුනක් තිබුනේය. මේ කියන ඉසිවරුන් සිටියේ මේ අපේ ශ්‍රී ලංකා ද්විපයේ ද

වි. ක.ධර්මබන්ධු